මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙරහුරු ඉලක්ක ප්‍රශ්න පත්‍රය - 2022 (2023)

**බුද්ධ ධර්මය I** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 01**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) සසර කතරේ අභියෝග ජයගත හැකි බවට සිදුහත් බෝසතුන්ට අවබෝධ වූයේ,
   i. ලෙඩෙක් නැමැති පෙරනිමිත්ත දැකීමෙනි.
   ii. පැවිදි රුවක් නැමැති පෙරනිමිත්ත දැකීමෙනි.
   iii. මහල්ලෙක් නැමැති පෙරනිමිත්ත දැකීමෙනි.
   iv. මළමිනියක් නැමැති පෙර නිමිත්ත දැකීමෙනි.

02) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු ප්‍රකාශ කළ පළමු උදාන වාක්‍ය වන්නේ,
   i. "අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස..." යන්නයි.
   ii. සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා..." යන්නයි.
   iii. "අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං..."යන්නයි.
   iv. "උත්තිට්ඨෝ නප්ප මජ්ජෙය්‍යා - ධම්මං සුචරිතං චරෙ..."යන්නයි.

03) බුදුරජාණන් වහන්සේ කළගුණ සැලකීමේ ගුණය ලෝකයාට ප්‍රථමයෙන්ම ආදර්ශයෙන් පෙන්වූයේ,
   i. පළමු සතියේ දී ය.
   ii. සිව්වන සතියේ දී ය.
   iii. තෙවන සතියේ දී ය.
   iv. දෙවන වන සතියේ දී ය

04) "යමෙක් ගිලනුන්ට උපස්ථාන කරයි ද, හෙතෙම මට උපස්ථාන කළා වේ" යන සම්බුද්ධ ප්‍රකාශය සිදුකරන ලද්දේ,
   i. පූතිගත්ත තිස්ස තෙරුන්ට පිහිට වූ අවස්ථාවේ ය.
   ii. උදරාබාධිත භික්ෂුවට පිහිට වූ අවස්ථාවේ ය.
   iii. පිප්ඵලී ගුහාවේදී මහා කාශ්‍යප මහරහතන් වහන්සේට පිහිට වූ අවස්ථාවේදී ය.
   iv. කලන්දක නිවාපයේ දී මුගලන් මහරහතන් වහන්සේට පිහිට වූ අවස්ථාවේදී ය.

05) ගැබිනි මාතාවන් උදෙසා භික්ෂූන් වහන්සේලා සිදුකරන විශේෂ පිරිත් සූත්‍රය වන්නේ,
   i. අංගුලිමාල පිරිත ය.
   ii. රතන පිරිත් සූත්‍රය ය.
   iii. ජල නන්දන පිරිත ය.
   iv. මහා මංගල සූත්‍ර පිරිත ය.

06) සංඝ රත්නය ගුණ ප්‍රකාශ කරන තැන "ආගන්තුකයන් සඳහා සූදානම් කළ ආහාරය වුවද පිළිගැනීමට සුදුසුය යන ගුණ ප්‍රකාශ වන්නේ,
   i. දක්ඛිණෙය්‍යා යන අදහස මගිනි.
   ii. අංජලිකරණීය යන අදහස මගිනි.
   iii. පාහුනෙය්‍යා යන අදහස මගිනි.
   iv. ආහුණෙය්‍යා යන අදහස මගිනි.

07) බුදුන් වහන්සේ සතු වූ කම්පා නොවීමේ ගුණය හඳුන්වා ඇත්තේ ,
   i. පද්මාකාර ගුණය ලෙසිනි.
   ii. පුරිසදම්මසාරථී ගුණය ලෙසිනි.
   iii. මහාකරුණා ගුණය ලෙසිනි.
   iv. තාදි ගුණය ලෙසිනි.

08) මෝඩකම, මුලාව අධික චරිතයක් වන්නේ,

i. මෝහ චරිත ය. ii. බුද්ධි චරිත ය. iii. දෝස චරිත ය. iv. විතර්ක චරිත ය.

09) ව්‍යාපාද නීවරණය උපමා කරනු ලබන්නේ,

i. පාසි සහිත ජලයට යි. iii. කැළඹුන ජලයට යි .

ii. උතුරන විට බුබුළු නැගෙන ජලයට යි. iv. බොර ජලයට යි.

10) ත්‍රි ලක්ෂණයට ඇතුළත් අනිත්‍ය ලක්ෂණය ට අනුව රූපස්කන්ධය උපමාකොට ඇත්තේ,

i. දිය බුබුළකට ය. iii. මිරිඟුවකට ය .

ii. පෙණ පිඩකට ය. iv. කෙසෙල් කඳකට ය.

11) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් නොවන අංගය මින් කුමක්ද?

i. කීර්තිය පැතිරීම. iii. සිහි මුලාවී කලුරිය කිරීම.

ii. මහත් භෝග සම්පත් ලැබීම. iv. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.

12) බෞද්ධයාගේ අත්පොත හෙවත් ධම්ම පද කෘතියට අනුව නිවැරදි වරණය වන්නේ,

i. වග්ග 29යි, ගාථා 423,නිධාන කතා 288කි. iii. වග්ග 26, ගාථා 432, නිධාන කතා 298කි.

ii. වග්ග 28, ගාථා 428 නිධාන කතා 399කි. iv. වර්ග 26කි,ගාථා 423 කි,නිධාන කතා 299 කි .

13) ධම්මපදය කෘතියට අනුව උත්සාහය, නිවැරදි සිහිය යන කරුණු ඇතුළත් ගාථා පාඨයට අදාළ වරණය තෝරන්න.

i. "උට්ඨානවතෝ - සතිමතෝ"යන ගාථා පාඨය. iii. "අත්තනාව කතං පාපං" යන ගාථා පාඨය.

ii. "තං ච කම්මං - කතං සාධු" යන ගාථා පාඨය. iv. අචරිත්වා බ්‍රහ්ම චරියන් යන ගාථා පාඨය.

14) පුද්ගල ජීවත්වීමේ හා මානව අයිතිය සුරක්ෂිත කිරීමේ ශික්ෂාපදය වන්නේ,

i. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂාපදයට යි. iii. ප්‍රාණඝාතයෙන් වැළකීමේ ශික්ෂාපදයට යි.

ii. සුරාමේරයෙන් වැළකීමේ ශික්ෂාපදයට යි. iv. කාම මිථ්‍යාචාරයෙන් වැළකීමේ ශික්ෂාපදයට යි.

15) දීඝජානු කෝලිය සිටු පුත්‍රයා හට මෙලොව යහපතට හේතුවන කරුණු අතරින් අයවැය මනාව තුලනය කර ගැනීම යන කරුණ පෙන්වා දී ඇත්තේ,

i. උට්ඨාන සම්පදාව තුළිනි. iii. කල්‍යාණ මිත්‍රතාව තුළිනි.

ii. සමජීවිකතාව තුළිනි. iv. ආරක්ඛ සම්පදාව තුළිනි.

16) මහා මංගල සූත්‍රයට අනුව පුද්ගලයාගේ දියුණුවට අදාළ කරුණු 38 අතුරින් "අනාකුලා ච කම්මන්තා"යන්නට අර්ථ කථනය කොට ඇත්තේ,

i. නිවැරදි ජීවන වෘත්තීන් හි යෙදීම. iii. ධර්මානුකූලව හැසිරීම.

ii. ශීලාදි වෘත්තීන් හි යෙදීම. iv. නිවැරදි කාය කර්මයන් හි යෙදීම.

17) බටහිර, නැගෙනහිර, දකුණ යන දිසාවලට උපමා කළ සමාජ කණ්ඩායම් ඇතුළත් වරණය තෝරන්න.

i. දෙමවුපියන්, ගුරුවරුන්, අඹුදරුවන් ය. iii. අඹු දරුවන්, ගුරුවරුන්, දෙමවුපියන් ය.

ii. ගුරුවරුන්, දෙමවුපියන්, අඹු දරුවන් ය. iv. අඹු දරුවන්, දෙමාපියන්, ගුරුවරුන් ය.

18) පරාභව සූත්‍රයෙහි සඳහන් පිරිහීමේ කරුණක් නොවන්නේ,

i. දෙමව්පියන්ට සැළකීමයි. iii. ධර්මයට අකමැති වීම වීමයි.

ii.උත්සාහයෙන් තොර වීමයි. iv. අසත්පුරුෂයන්ට ප්‍රිය වීමයි.

19) සිගාලෝවාද සූත්‍රයට අනුව නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම.

i. සේවකයා විසින් සේව්‍යයාට කළ යුතු යුතුකමකි. iii. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට කළ යුතු යුතුකමකි.

ii. ගිහියා විසින් පැවිදි උතුමන්ට කළ යුතු යුතුකමකි. iv. බිරිඳ විසින් ස්වාමියාට කළ යුතු යුතුකමකි.

20) "සම වායෝ එව  සාධු"මෙහි අර්ථය වන්නේ,

i.  සමගියෙන්  තොර දිවියක් නැත. iii. සමගියම යහපති.

ii. සමගි වන්න විවාද නොකරන්න. iv. සමගියෙන් තොර සාමයක් නැත.

21) සිතීමේ හා විමසීමේ නිදහස සාකච්ඡා කිරීමේ දී අදාළ කරගත හැකි ප්‍රධානතම සූත්‍රය වන්නේ,

i.දම්සක් පැවතුම් සූත්‍රය. iii. කාලාම සූත්‍රය.

ii. පරාභව සූත්‍රය. iv. ව්‍යග්ගපජ්ජ සූත්‍රය.

22) “වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ වසන්නෙමු. රාගාදී කෙලෙස් නිසා රෝගී වූ මිනිසුන් අතර අපි කෙලෙස් ලෙඩ නොමැතිව සුවසේ වසන්නෙමු"මෙම පාඨය තුළින් ඉස්මතු වන්නේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයක්ද?

i.  තාදී ගුණය යි. iii.  පුරිසධම්ම සාරථී ගුණය යි.

ii. අසරණ සරණ ගුණයයි. iv.  පද්මාකාර ජීවිතයයි.

23) චූල්ල කම්ම විභංග සූත්‍රයට අනුව පෙරකරන ලද කර්මවලට  විපාක විඳීමට සිදුවෙයි. ඒ අනුව රෝගියකු වී උපදින්නේ කුමන අකුසලයක් සිදු කිරීමෙන් ද?

i. සතුන්ට හිංසා කිරීමෙනි. iii. ගරු කළ යුත්තන්ට ගරු නොකිරීමෙනි.

ii. අන් සැපතට ඊර්ෂ්‍යා කිරීමෙනි. iv. තමා සතු දේ අන් අයට නො දීමෙනි.

24) බෞද්ධ හේතුඵලවාදී දර්ශනයට අනුව “අවිද්‍යාව ”ඇති කල්හි,

i.  නාම රූප ඇත. iii. විඤ්ඤාණය ඇත.

ii. සංස්කාර ඇත. iv. සළායතන ඇත.

25) "ඉමස්මිං  සති ඉදං හෝති" යන කෙටි සූත්‍රපාඨයෙහි අර්ථය වන්නේ,

i. මෙය නැති වීමෙන් මෙය නැති වේ යන්නයි. iii.  මෙය ඇති කල්හි මෙය ඇති වේ යන්නයි.

ii. මෙය හට ගැනීමෙන් මෙය හටගනී යන්නයි. iv.  මෙය නැති කල්හි මෙය ඇති නොවේය යන්න යි.

26) කායානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨානය දියුණු කරගත හැක්කේ,

i.  සම්මා  සතිය වැඩීමෙනි. iii.  සම්මා දිට්ඨියෙන් යුතු වීමෙනි.

ii. සම්මා සමාධිය  වැඩීමෙනි. iv.  සම්මා ආජීවයෙන් යුතු වීමෙනි.

27) කර්මයේ බලපෑම කෙතරම් තීරණාත්මක වුවද වර්තමාන කර්මවලින් අතීත කර්ම ශක්තිය වෙනස් කරගත හැකි කරුණු හතරක් දහමෙහි සඳහන් වේ.එහි දී දුගී පවුලක උපත ලැබුවද ඉහළ මට්ටමේ රූප සම්පත්තිය නිසා වාසනාවන්ත ජීවිතයක් ගත කිරීම හඳුන්වා ඇත්තේ,

i. උපධි සම්පත්තිය ලෙස ය. iii. ගති සම්පත්තිය ලෙස ය.

ii. ප්‍රයෝග සම්පත්තිය ලෙස ය. iv. කාල සම්පත්තිය ලෙස ය.

28) භික්ෂූන් වහන්සේලාගේ කායික නිරෝගීතාවය අරමුණු කරගෙන බුදුරජාණන් වහන්සේ ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත අනුමත කරන ලද්දේ,

i.  පමණ දැන ආහාර වැළඳීම ය. iii. ජලය පෙරා පානය කිරීම ය

ii. කායික ව්‍යායාමවල යෙදීම ය. iv. සක්මන්  මළුවය.

29) පළමු, දෙවන හා තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ අගනගර තුන අනුපිළිවෙලට පිහිටා ඇති වරණය තෝරන්න.

i.  රජගහනුවර, විශාලා මහනුවර පැළලුප් නුවර ය. iii. පැළලුප් නුවර, විශාලා මහනුවර, රජගහ නුවර ය.

ii. රජගහනුවර ,පැළලුප් නුවර,විශාලා මහ නුවර ය. iv. විශාලා මහනුවර, පැළලුප් නුවර,රජගහ නුවර ය.

30) දේශ දේශාන්තරල ධර්මය ව්‍යාප්ත කිරීමේ දී සෝණ, උත්තර යන තෙරුන් වහන්සේලා ධර්මය රැගෙන ගිය දේශය නම්,

i. තම්බපණ්ණිය යි. iii. ස්වර්ණ භූමියයි.
ii. කාශ්මීරය යි .iv. හිමවත් පෙදෙසයි.

31) ආහාර පරිභෝජනයේ දී අනුන්ගේ අත් උදව් නැතිව නැගිට ගන්නටවත් බැරිතරමට ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන ලද්දේ,

i. ආහාර හත්ථක ලෙසය. iii. තත්ථා වට්ටක ලෙසය.
ii. භුත්තවම්තක ලෙසය. iv. කාක මාසක ලෙසය.

32) ධාර්මිකව උපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලැබෙන සැපය චතුර්විධ සුඛ සංකල්පයට අනුව හඳුන්වා ඇත්තේ,

i. අණන සුඛය ලෙසය. iii. අනවජ්ජ සුඛය ලෙසය.
ii. අත්ථි සුඛය ලෙස ය. iv. භෝග සුඛය ලෙස ය.

33) බුද්ධාලම්බන ප්‍රීතිය ට වඩා ශෘංගාරය ඉස්මතු කෙරෙන නූතන චිත්‍ර කලා විෂයයෙහි ප්‍රබල නිර්මාණ කරුවෙක් ලෙස හැඳින්විය හැක්කේ,

i. ජෝර්ජ් කීට් මහතා ය. iii. සෝමබන්දු විද්‍යාපති මහතා ය.
ii. ඇල්බට් ධර්මසිරි මහතාය. iv. සෝලියස් මෙන්ඩිස් මහතා ය.

34) බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතරින් දස රාජ ධර්ම වල සඳහන් මධ්‍යස්ථ ගැටුම්වලින් තොරව රාජ්‍ය පාලනය විස්තර කොට ඇත්තේ,

i. අක්‍රෝධය ලෙසිනි. iii. අවිරෝධතා ලෙසිනි.
ii. ඍජු බව ලෙසිනි. iv. ඉවසීම ලෙසිනි.

35) පත්තකම්ම සූත්‍රය ට අනුව "අතිථි"බලි යනුවෙන් සඳහන් කරන ලද්දේ ,

i. ඥාති සංග්‍රහය යි. iii. රජයට බදු මුදල් ගෙවීමයි.
ii. මියගිය ඥාතීන්ට යුතුකම් ඉටු කිරීමයි. iv. ආගන්තුක සත්කාර යයි.

36) බෞද්ධ කලා නිර්මාණ අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම පිහිටා ඇති අග්‍රගන්‍ය කලා නිර්මාණය මින් කුමක්ද?

i.වාහල්කඩ යි. iii. වටදාගෙය යි.
ii. බෝධිඝරය යි. iv. මුරගලයි.

37) හිඳගල හා සීගිරි චිත්‍ර කුමන යුගයට අයත් වන්නේ ද?

i. අනුරාධපුර යුගයට යි. iii. මහනුවර යුගයට යි.
ii. පොළොන්නරු යුගයට යි. iv. නූතන යුගයට යි.

38) ගුරුළුගෝමී පඬිතුමන් විසින් රචනා කරන ලද **අමාවතුර** කෘතිය සඳහා තේමා කර ගනු ලැබුවේ,

i. සම්මා සම්බුද්ධ ගුණය යි. iii. පුරිසධම්ම සාරථී ගුණය යි.
ii. අරහං ගුණය යි. iv. නව අරහාදී ගුණය යි.

39) බෞද්ධ කලාවේ චෛත්‍යය වල හැඩතල අනුව බෙදා දක්වා ඇති චෛත්‍ය වර්ග ගණන නම්,

i. 6 කි. ii. 8 කි. iii. 9 කි. iv. 12 කි.

40) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග ඇතුළත් වන්නේ,

i. සීල ශික්ෂාවට ය. iii. ප්‍රඥා ශික්ෂාවට ය.
ii. සමාධි ශික්ෂාවට ය. iv. නිවනට ය.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak; මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙරහුරු ඉලක්ක ප්‍රශ්න පත්‍රය - 2022 (2023)

**බුද්ධ ධර්මය II** | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 2 යි**

- **සැලකිය යුතුයි,**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) i. "මෙවන් පුතෙකු ලද මවක්, පියෙක් නිවුනෝ වෙති" යනුවෙන් අදහස් ප්‍රකාශ කරමින් සිදුහත් කුමරුව අගය කළ ශාක්‍ය කුමරිය නම් කරන්න.

ii. "සමග්ගා හෝථ මා විවදථ" යන සම්බුද්ධ පාඨයේ අර්ථය කුමක්ද?

iii. බුදු ගුණ නවය අතරින් දෙකක් නම් කරන්න.

iv. බුදු රදුන්ගෙන් උවටැන් ලද ගිලන් හිමිවරු දෙදෙනකු නම් කරන්න.

v. වෙස්සන්තර හා මඛාදේව යන ජාතක කතා අදාළ කරගත හැකි පාරමිතා දෙක අනු පිළිවෙලින් ලියන්න.

vi. "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව..."
"සිංහලයිනි නැගිටිව්..."මෙම ප්‍රකාශ කළ උතුමන් දෙදෙනා පිළිවෙලින් දක්වන්න.

vii. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.

viii. පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, ලියූ ග්‍රන්ථ කතෲවරු දෙදෙනා නම් කරන්න.

ix. ශ්‍රී ලංකාවේ මුලින්ම පැවිදි වූ භික්ෂුව හා භික්ෂුණිය නම් කරන්න.

x. බුදු පිළිමයක දක්නට ඇති ආසන එකක් හා මුද්‍රා එකක් නම් කරන්න.

02) i. පාරමිතා යන්න අර්ථ දක්වන්න.
ii. සෑම පාරමිතාවක්ම බෙදෙන ප්‍රධාන කොටස් තුන දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. පාරමිතාවලින් ලබාගත හැකි ශිෂ්‍ය ආදර්ශ පාරමිතා දෙකක් ඇසුරෙන්පෙන්වා දෙන්න.

03) i. තංච කම්මං කතං සාධූ යන ධම්මපද ගාථා ව සම්පූර්ණ කරන්න.
ii. එම ගාථාවේ තේරුම ලියන්න.
iii. හස්තසාර ග්‍රන්ථය ලෙස සලකන ධම්මපදය සාරධර්ම පිරි සමාජයක් බිහි කර ගැනීමට ආදර්ශ සපයන අයුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

04) i. දෙයාකාර වූ පරිසරය නම් කරන්න.
ii. බුදුරදුන් පරිසර හිතකාමීව කටයුතු කළ අවස්ථා තුනක් නම් කරන්න.
iii. පාරිසරික ගැටලු අවම කර ගැනීමේ ලා බුදු දහමේ ඉගැන්වීම් ප්‍රයෝජනයට ගන්නා ආකාරය පෙන්වා දෙන්න.

05) i. පලමු ධර්ම සංගායනාව පැවැත් වීමට බලපෑ ප්‍රධාන හේතුව නම් කරන්න.
ii. එම ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ, අනුග්‍රහය ලබාදුන් පාලකයා හා පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.
iii. ශාසන චිරස්ථිතිය උදෙසා පළමු ධර්ම සංගායනාවෙන් ඉටු වූ මෙහෙය පැහැදිලි කරන්න.

06) i. චතුරාර්ය සත්‍යය නම් කරන්න.
ii. ත්‍රිවිධාකාර වූ තණ්හාව කෙටියෙන් පහදන්න.
iii. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් සදාචාර සම්පන්න ජීවිතයකට මග සලසාගත හැකිය.මේ පිලිබඳව ඔබගේ අදහස් දක්වන්න.

07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
i. රේරුකානේ චන්දවිමල මහනාහිමි.
ii. කනිෂ්ක ධර්ම සංගායනාව.
iii. සතර බ්‍රහ්ම විහරණ.
iv. සඳකඩපහණ.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfkfy;tpf;tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak;මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone kj;Jfk fy;tpf; tyak මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## පෙරහුරු ඉලක්ක ප්‍රශ්න පත්‍රය – 2022(2023)

**බුද්ධ ධර්මය** | **11 ශ්‍රේණිය** | **පිළිතුරු පත්‍ර**

## පිළිතුරු - පත්‍රය 1

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | - | ii | (11) | - | iii | (21) | - | iii | (31) | - | i |
| (2) | - | iii | (12) | - | iv | (22) | - | iv | (32) | - | iv |
| (3) | - | iv | (13) | - | i | (23) | - | i | (33) | - | i |
| (4) | - | i | (14) | - | iii | (24) | - | ii | (34) | - | iii |
| (5) | - | i | (15) | - | ii | (25) | - | iii | (35) | - | iv |
| (6 ) | - | i | (16) | - | i | (26) | - | i | (36) | - | ii |
| (7) | - | iv | (17) | - | iv | (27) | - | i | (37) | - | i |
| (8) | - | i | (18) | - | i | (28) | - | iv | (38) | - | iii |
| (9) | - | ii | (19) | - | ii | (29) | - | i | (39) | - | i |
| (10) | - | ii | (20) | - | iii | (30) | - | iii | (40) | - | i |

(එක් පිළිතුරකට එක් ලකුණ බැගින් මුලු ලකුණු 40 කි.)

අ.පි.බ. —>

# පිළිතුරු - පත්‍රය II

1) i. කිසා ගෝතමිය.

ii. විවාද නොකොට සමගි වන්න.

iii. අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝක විදූ, අනුත්තර පුරිසදම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා

iv. පූතිගත්ත තිස්ස හිමි, උදරාබාධයෙන් පෙළුනු භික්ෂුව, මහා කාශ්‍යප හිමි.

v. වෙස්සන්තර ජාතකය - දාන පාරමිතාව
මඛාදේව ජාතකය - නෙක්ඛම්ම පාරමිතාව

vi. දුටු ගැමුණු රජතුමා / අනගාරික ධර්මපාල තුමා

vii. ශිෂ්‍යයා විසින් ගුරුවරයාට ඉටු කළයුතු යුතුකම්

- ගුරුවරයාව දුටු විට හුනස්නෙන් නැගිටීම.
- අවශ්‍ය උපස්ථාන කිරීම.
- අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුන්කන් දීම.
- අවශ්‍යය කටයුතු ඉටුකරදීම.
- මැනවින් ඉගෙන ගැනීම.

viii. පූජාවලිය - මයුරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර හිමි
සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන හිමි

ix. අරිට්ඨ කුමරු හා අනුලා දේවිය.

x. ආසන - වීරාසන, භද්‍රාසන, පද්මාසන, වජ්‍රාසන
මුද්‍රා - ධ්‍යාන මුද්‍රාව, අභය මුද්‍රාව, වරද මුද්‍රාව, විතර්ක මුද්‍රාව, ධර්ම චක්‍ර මුද්‍රාව, භූමි ස්පර්ශ මුද්‍රාව.

**(එක් පිළිතුරකට ලකුණු 2 බැගින් මුලු ලකුණු 20 කි.)**

- අංක 2 සිට 6 දක්වා ප්‍රශ්නවලට ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න. එක පිළිතුරකට ලබා දියහැකි උපරිම ලකුණු ප්‍රමාණය 10 කි. **(2+3+5 =10)**

- හත් වන ප්‍රශ්නය සඳහා තෝරා ගන්නා කොටස් 2 වෙනුවෙන් එක කොටසකට ලකුණු 5 බැගින් මුලු ලකුණු ප්‍රමාණය 10 කි. **(5+5 =10)**

- ඒ අනුව **II පත්‍රය** සඳහා ලබාගත හැකි **මුලු ලකුණු ප්‍රමාණය 60 කි.**

අ. පො. ස. (සා පෙළ)

# විභාගය

උපදෙස් බිඳක් . . . .

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- ප්‍රවේශ පත්‍රයේ බලයලත් අයෙකු ලවා ඔබේ අත්සන සහතික කරවා ගන්න . (පාසල් සිසුන් සඳහා විදුහල්පති)
- කාලසටහන, ප්‍රවේශ පත්‍රය, හැඳුනුම්පත, කාබන් පෑන්, පැන්සල්, මකනය, කෝදුව, වතුර බෝතලය, (ඔරලෝසුව) සූදානම් කරගන්න . (මකන දියර භාවිතා කළ නොහැක වැරදීමක් වූ විට එක් ඉරකින් කපා දමන්න)
- විශේෂ දිනවලට අවශ්‍ය දේද වේලාසනින් සූදානම් කර තබා ගන්න . (පාට- කවකටු -ගණක යන්ත්‍රය . . . .
- සියල්ල විනිවිද පෙනෙන අසුරනයක බහාලීම වඩා සුදුසු ය .

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022


- ආරම්භක අවස්ථාවට පැය භාගයකටවත් කලින් විභාග ශාලාවට යන්න.
- ආරම්භයට පැය භාගයකට කලින් අංකයට අදාළ අසුනේ වාඩි විය හැකියි.
- ඩෙස්ක් - පුටුව නිසි පරිදි නොමැතිනම් නිරීක්ෂක මහතා ගේ/මහත්මියගේ සහායෙන් සකස් කර ගන්න
- නිරීක්ෂක මයා/මියට කතා කළයුතුනම් පෑනෙන් ඩෙස්ක් එකට කීප වතාවක් තට්ටු කරන්න

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- දැන්වූ විට ළඟ ඇති සටහන් ආදිය ඉවත් කරන්න.
- ළඟ තබාගත හැක්කේ පෑන්, පැන්සල්, ආදී උපකරණ හා ජල බෝතලය පමණි.
- වතුර බෝතලය බිම තබන්න.
- අවසාන අවස්ථාවේ සටහන් බැලීමට වඩා විවේකයෙන් සිටීම සුදුසුය.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- පැය කාලකට පමණ පෙර ලියන පොත හා කටු වැඩ කොළ ලැබෙනු ඇත.
- ලියන පොතේ මුල් පිටුවේ ඉහළ කොටසේ හැකි මූලික තොරතුරු සම්පූර්ණ කරන්න.




ඔබට පිළිතුරු ලිවීමට ලැබෙන පොතේ මුල් පිටුව

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අයදුම්කරුගේ ප්‍රයෝජනය සඳහා / பரீட்சார்த்தியின் உபயோகத்திற்கு

#### අයදුම්කරුට උපදෙස්

1. ඉදිරි කොටු තුළ අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.
2. සෑම කඩදාසියක ම දෙපැත්තෙහි ම ලියන්න.
3. මෙම පොතෙහිත් පිළිතුරු ලිවීම සඳහා ලබා ගන්නා සියලු ම අතිරේක කඩදාසිවලත් විභාග අංකය හා ප්‍රශ්න අංකය නිවැරදිව ලියන්න. අතිරේක කඩදාසිවල පිටු අංකය නිවැරදිව ලියා මෙම පිළිතුරු පොතට අමුණන්න.
4. කටු සටහන් සඳහා භාවිත කළ කඩදාසි ද අමුණා එම කඩදාසිවල සෑම පිටුවක් ම හරස් ඉරකින් කපා හරින්න.
5. මෙම පිළිතුරු පොතෙහි අඩංගු කිසිදු කඩදාසියක් හෝ කොටසක් කඩා ඉවත් කිරීම තහනම් ය.

#### பரீட்சார்த்திக்கான அறிவுறுத்தல்கள்

දකුණු පස කොටස් සම්පූර්ණ කරන්න

4. பரும்படி வேலைகளுக்குப் பயன்படுத்திய தாள்கள் ஒவ்வொன்றையும் குறுக்கே கோடிட்டு நீக்கி, விடைத்தாள்களுடன் இணைக்குக.
5. இவ்விடைப் புத்தகத்தில் அடங்கியுள்ள தாள்களையோ அல்லது பகுதிகளையோ கிழித்து அகற்றுதல் தடை செய்யப்பட்டுள்ளது.

විභාගයේ නම සහ වර්ෂය
பரீட்சையின் பெயரும் ஆண்டும்

විභාග අංකය
பரீட்சைச் சுட்டெண்

විෂය අංකය
(ප්‍රශ්න පත්‍රයේ සඳහන් පරිදි)
பாட எண்
(வினாத்தாளில் குறிப்பிடப்பட்டுள்ளவாறு)

විෂයය
பாடம்

ඉහත තොරතුරු නිවැරදි බවට
නිරීක්ෂකගේ කෙටි අත්සන සහ දිනය
பரீட்சைச் சுட்டெண் சரியானது என்று
நோக்குநரின் சிற்றொப்பமும் திகதியும்

පිළිතුරු ලියා ඇති පිටු සංඛ්‍යාව
விடை எழுதப்பட்டுள்ள
பக்கங்களின் எண்ணிக்கை

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- ඇතුළු පිටුවලද විභාග අංක යෙදීම සුදුසු ය.
- ප්‍රවේශ පත්‍රයේ (**admission**) විෂය, කුමන පත්‍රයද යන්න ( i, ii, iii ), දිනය හා ඉහත දක්වා ඇති සුපරුදු අත්සන ම යොදන්න.
- නියමිත වේලාවට ප්‍රශ්න පත්‍රය ලැබුණ විට තමන්ට අදාළ විෂය බව, නියමිත කොටස් ප්‍රමාණය, පිටු සියල්ල මුද්‍රණය වී ඇතිද යන්න හා පැහැදිළි බව පිළිබඳ තහවුරු කරගන්න.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022


- ප්‍රශ්න පත්‍රයේ ඇති උපදෙස් පිළිපදින්න.
- තෝරාගත හැකි ප්‍රශ්න අතිවිට අනිවාර්ය ප්‍රශ්න හැර ඉතිරි ප්‍රශ්න අතරින් ඔබට පහසු ප්‍රශ්න තෝරා තරු ලකුණ ( * ) යොදන්න.
- තෝරා ගැනීමේ දී ප්‍රශ්නයට අදාළ සියලු කොටස් වලට පිළිතුරු සැපයිය හැකිදැයි සැලකිළිමත් වන්න.
- තෝරා ගැනීම සඳහා අමතර විනාඩි දහයක කාලයක් ලැබේ.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- පිළිතුරු ලිවීමේදී පැහැදිළි බව තබාගන්න (ඡේද වෙන් කිරීම විශේෂ කරුණු වෙනත් පාට පෑනකින් ලිවීම ( කළු හා නිල් පමණි).
- අකුරු පැහැදිළි වියයුතු අතර ලස්සන අත්‍යවශ්‍ය නොවේ
- අලුත් ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමේදි අලුත් පිටුවක් ගන්න.
- පිළිතුරු ලියූ පසු එම ප්‍රශ්නයට ප්‍රශ්න පත්‍රයේ හරි ලකුණ ( √ ) යෙදීම ඔබට පහසුවක් වේ.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- කාලය කළමනාකරණය කරගන්න.
- අමතර කඩදාසිවල ලීවේනම් අවසාන විනාඩි 5 -10 ඇතුළත (අවශ්‍ය කොටස්) පිළිවෙළට තබා ලැබෙන නූලෙන් ගැට ගසන්න.
- කාලය ඉතිරි වූයේ නම් පිළිතුරු පත්‍රය නැවත බලමින් අඩුපාඩු සකස් කළ හැක.
- යම් හෙයකින් වේලාව මදිවන බවක් හැඟේනම් පමනක් අවසාන පිළිතුර විස්තරාත්මකව නැතිව වැදගත් කරුණු
- ( point ) සටහන් කරන්න.




පොතේ පිටු 12කි . එය ලියා අවසන් වූයේ නම් මෙවැනි අමතර කඩදාසි අවශ්‍ය තරම් ඉල්ලා ගත හැකිය .

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

- නියමිත වේලාවට පිළිතුරු පත්‍රය භාර දී දැන්වූ පසු නැගිටින්න.
- ලියූ පත්‍රය පිළිබඳ කතා නොකොට ඊළඟ දවසට සූදානම් වෙන්න.
- ඉහත උපදෙස් පිළිපදිමින් සාර්ථකව විභාගයට මුහුණ දෙන්න
- ඔබට ජයග්‍රාහී විභාගයක් වේවා !!!

ගුරු උපදේශක
මහින්ද දිසානායක
කලාප අධ්‍යාපන කාර්යාලය
තඹුත්තේගම

## අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022

# බුද්ධ ධර්මය

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

## i පත්‍රය

- බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.
- පිළිතුරු හතර බැගින් වූ ප්‍රශ්න 40කි.
- ලකුණු 40ක් හිමි වේ.
- 10, 11 ශ්‍රේණි පෙළපොත් ඇසුරින් බොහෝ දුරට ප්‍රශ්න සැකසේ.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- කීප වතාවක් පෙළපොත් පරිශීලනය කිරීමෙන් පිළිතුරු සැපයීම පහසු වේ
- පිළිතුරු සැපයීම සඳහා ‘කොටු කොළයක්’ ලැබේ
- ප්‍රශ්නය ට අදාළ පිළිතුර හඳුනාගෙන කොටු කොළයේ ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති නිවැරදි පිළිතුරු අංකය කතිරයකින් සලකුණු කළ යුතුය
- උදා ඃ- 5ට නිවැරදි පිළිතුර තුන නම් **5** ① ② ~~③~~ ④

අ.පො.ස. (සා.පෙළ) විභාගය/ க.பொ.த(சா.தர)ப் பரீட்சை/ G.C.E. (O/L) Examination - 2020 (2021)

# උත්තර පත්‍රය/விடைத்தாள்/Answer Sheet

විෂයය සහ විෂය අංකය
பாடமும் பாட எண்ணும்
Subject and Subject No.

මාධ්‍යය
மொழிமூலம்
Medium

විභාග අංකය
சுட்டெண்
Index No.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ① | ② | ③ | ④ | 11 | ① | ② | ③ | ④ | 21 | ① | ② | ③ | ④ | 31 | ① | ② | ③ | ④ |
| 2 | ① | ② | ③ | ④ | 12 | ① | ② | ③ | ④ | 22 | ① | ② | ③ | ④ | 32 | ① | ② | ③ | ④ |
| 3 | ① | ② | ③ | ④ | 13 | ① | ② | ③ | ④ | 23 | ① | ② | ③ | ④ | 33 | ① | ② | ③ | ④ |
| 4 | ① | ② | ③ | ④ | 14 | ① | ② | ③ | ④ | 24 | ① | ② | ③ | ④ | 34 | ① | ② | ③ | ④ |
| 5 | ① | ② | ③ | ④ | 15 | ① | ② | ③ | ④ | 25 | ① | ② | ③ | ④ | 35 | ① | ② | ③ | ④ |
| 6 | ① | ② | ③ | ④ | 16 | ① | ② | ③ | ④ | 26 | ① | ② | ③ | ④ | 36 | ① | ② | ③ | ④ |
| 7 | ① | ② | ③ | ④ | 17 | ① | ② | ③ | ④ | 27 | ① | ② | ③ | ④ | 37 | ① | ② | ③ | ④ |
| 8 | ① | ② | ③ | ④ | 18 | ① | ② | ③ | ④ | 28 | ① | ② | ③ | ④ | 38 | ① | ② | ③ | ④ |
| 9 | ① | ② | ③ | ④ | 19 | ① | ② | ③ | ④ | 29 | ① | ② | ③ | ④ | 39 | ① | ② | ③ | ④ |
| 10 | ① | ② | ③ | ④ | 20 | ① | ② | ③ | ④ | 30 | ① | ② | ③ | ④ | 40 | ① | ② | ③ | ④ |

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව
சரியான விடைகளின் எண்ணிக்கை
No.of correct responses

පරීක්ෂක සංකේත අංකය හා අත්සන/
விடைத்தாள் பரீட்சகர்களின் குறியீட்டெண்ணும் ஒப்பமும்/
Code No. and Signature of

Examiner 1 ..............................................................
Examiner 2 ..............................................................
EMF ..............................................................

I පත්‍රයේ මුළු ලකුණු
பத்திரம் I இன் மொத்தப் புள்ளி
Total Marks of Paper I

* උපදෙස් සඳහා පසුපිට බලන්න./அறிவுறுத்தல்களுக்கு மறுபக்கம் பார்க்கவும்/Please turn over for instructions.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

## ii පත්‍රය

- ප්‍රශ්න 7කි
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු ලිවිය යුතුය
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කි
- අනෙක් ප්‍රශ්න එකකට ලකුණු 10 බැගිනි

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- කෙටි ප්‍රශ්න 10කි
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගිනි (2x10 =20)
- බහුවරණ මෙන් පිළිතුර තේරීමට නොවේ
- කෙටි පිළිතුරක් ලිවිය යුතුය
- උදාඃ-

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- i බුදුරජාණන් වහන්සේ තුළ පැවති අසරණ සරණ ගුණයට නිදසුන් දෙකක් දෙන්න

  **පටාචාරා**

  **භද්‍රවතිකා ඇතින්න**

- ii සිව්බඹ විහරණ අතරින් දෙකක් ලියන්න

  **කරුණා**

  **මුදිතා**

# 2 සිට 6 දක්වා ප්‍රශ්න එකම ආකෘතියකි උදා:-

- i 'නතං කම්මං කතං සාධු ......' ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)
- ii එම ගාථාවේ සරල අදහස ලියන්න. (ලකුණු 3)
- iii විශ්ව සමාජයට ආදර්ශ සපයන ග්‍රන්ථයක් ලෙස 'ධම්මපදය' අගයන්න. (ලකුණු 5)

- i බෞද්ධ කලා ශිල්ප අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
- ii බුදු පිළිමවලට ආවේණික මුද්‍රා තුනක් නම් කරන්න. (ලකුණු 3)
- iii බෞද්ධ කලා උරුම ආරක්ෂා කිරීමේ වටිනාකම පැහැදිලි කරන්න. (ලකුණු 5)

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- 7 ප්‍රශ්නය
- කෙටි සටහන් ලිවීම සඳහා මාතෘකා හතරකි
- ඉන් දෙකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතුය
- එක් මාතෘකාවකට වචන 75 නොඅඩු විය යුතුයි
- එක් කෙටි සටහනකට ලකුණු 5කි (5x2 =10)
- උදා:-

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- මෙම මාතෘකා අතරින් දෙකකට පිළිතුරු ලියන්න.

i පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි.

ii සිව් බඹ විහරණ

iii සඳකඩපහණ.

iv සමජීවිකතා.

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- 2 සිට 7 දක්වා ප්‍රශ්න විනාඩි කීපයක් ගෙන අවබොධයෙන් කියවන්න
- 2 සිට 6 දක්වා ප්‍රශ්නවල කොටස් තුනටම පහසුවෙන් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්න තෝරා * ලකුණ යොදන්න
- 7 ප්‍රශ්නයේ පහසු මාතෘකා දෙකක් තෝරා * ලකුණ යොදන්න

# අ. පො. ස. (සා පෙළ) විභාගය - 2022 - බුද්ධ ධර්මය

- 2 සිට 7 දක්වා ප්‍රශ්න අතරින් තෝරාගත යුත්තේ ප්‍රශ්න 4 ක් පමණි
- උත්තර ලියූ පසු ප්‍රශ්න පත්‍රයේ අදාළ අංකයට √ යෙදීම ඔබට පහසුවක් වේවි

# 2022 වර්ෂයේ අනුමාන

- අ.පො. ස සා. පෙළ විභාගය (2022)
- බුද්ධ ධර්මය - අනුමාන ප්‍රශ්න - II පත්‍රය

- (10, 11 ශ්‍රේණිවල පෙළපොතේ දැක්වෙන පහත සඳහන් තේමා කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න).

- ප්‍රශ්න අංක 01 සඳහා
- ✓ කෙටි පිළිතුරු අපේක්ෂා කරන කෙටි ප්‍රශ්න 10 කින් යුක්තය.

# ප්‍රශ්න අංක 02 සඳහා

අභියෝග (10 ශ්‍රේණිය -1 පාඩම,
11 ශ්‍රේණිය -1 පාඩම)

# 22 - 2

i අභියෝගයක් යනු කුමක්ද?

ii බෝසතුන් මුහුණ දුන් අභියෝග තුනක් නම් කරන්න

iii ශිෂ්‍ය ජීවිතයට එල්ල වන අභියෝග ජය ගැනීමට බෝසත් චරිතයෙන් ගතහැකි ආදර්ශ විස්තර කරන්න

# ප්‍රශ්න අංක 03 සඳහා (ධම්මපදය)

උට්ඨානවතෝ සතිමතෝ
අචරිත්වා බ්‍රහ්මචරියං
නතං කම්මං කතං සාධු
(10- 7, 11- 6)

# 22 - 3

i කොස්වා ලිහිණියා පසුතැවෙන ආකාරය දැක්වෙන ධම්මපද ගාථාව ලියන්න

i නතං කම්මං සාධු.. ගාථාව සම්පූර්ණ කරන්න

ii එහි අර්ථය ලියන්න

iii පුද්ගල ජීවිතය සාර්ථක කරගැනීමට වටිනා උපදේශ සපයන කෘතියක් ලෙස ධම්මපදය අගයන්න

# ප්‍රශ්න අංක 04 සඳහා (බුද්ධ ධර්මය)

හේතුඵල දහම

22 - 4

# රාජ ධර්ම /

# පටිච්ච සමුප්පාදය

# 22 - 5

## ප්‍රශ්න අංක 05 සඳහා

**මහින්ද්‍රාගමනය**

**ස්ථූප කලාව**

# ප්‍රශ්න අංක 06 සඳහා (සංගායනා)

දෙවන ධර්ම සංගායනාව (11-108)

පළමු ධර්ම සංගායනාව

(කණිෂ්ක සංගායනාව (10-19))

- ප්‍රශ්න අංක 07 සඳහා (කෙටි සටහන් )

✓ ථේරපුත්තාභය / ථේරුකාණෝ චන්ද්‍රවිමල නාහිමි

✓ දුටුගැමුණු රජු

✓ සතර සංග්‍රහ වස්තු (10-22)

✓ සිව්බඹ විහරණ (11-22)

✓ සතර අගති

✓ පාරමිතාවක්

✓ අණ්ණ සුබය (11-20)

22 - 7

<u>චන්ද්‍ර විමල හිමි</u> / <u>දුටු ගැමුණු රජු</u>

අඥාන සුඛ

සඳකඩ පහණ

සතර අගති

# තෙරුවන් සරණින් ඔබට ජය වේවා

ගුරු උපදේශක
මහින්ද දිසානායක
කලාප අධ්‍යාපන කාර්යාලය
තඹුත්තේගම

# අ.පො.ස. සා.පෙළ

# බුද්ධ ධර්මය

## 10 , 11 ශ්‍රේණි

බහුවරණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයමු

උපදෙස් :-

- ✓ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න
- ✓ අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න

01) බුදු සිරිත අභියෝගවලින් ගහණ වූවකි.
බුදුරජාණන් වහන්සේ  මුහුණ දුන් පළමු අභියෝගය වන්නේ,

1 දස මරුන් පැරද වීමයි.
2 මාර දූවරුන්ට මුහුණ දීමයි.
3 සත් සතිය ගත කිරීමයි.
4 පළමු දම් දෙසුම පැවැත්වීමයි.

## 02) සත්ත්වයා මුහුණ දෙන සතර දුක් අතර ව්‍යාධි දුක යනු

1 ඉපදීම පිළිබඳ දුක වේ.

2 වයසට යාම පිළිබඳ දුක වේ.

3 රෝද්‍දුක්වලට ගොදුරුවීම පිළිබඳ දුක වේ.

4 මිය යාම පිළිබඳ දුක වේ.

03) සාංසාරික විමුක්තිය සලසා ගැනීමෙන් සියලු දුක් කෙළවර කරගත හැකි බව සිදුහත් කුමරුට අවබෝධ කර ගැනීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් වූයේ,

1 පංච මහා විලෝකනයයි.

2 සරණ බන්ධනයයි.

3 රාහුල කුමාරෝත්පත්තියයි.

4 සතර පෙර නිමිති දැකීමයි.

04) ‘‘අරඹව් ,නික්මෙව්, යෙදෙව් බුදු සසුන්හි. දිනව්, මරසෙන් පරදා බට කැළයට වැදි ඇතෙකු සේ’’ මෙම අර්ථය සහිත ගාථාව ඇතුළත් සූත්‍ර දේශනාව නම්,

1 නිබ්බේධික සූත්‍රයයි.

2 අරුණවතී සූත්‍රයයි.

3 පරිනිබ්බාන සූත්‍රයයි.

4 සිගාලෝවාද සූත්‍රයයි.

05) සොරුන් අතින් ගිලිහී වැටී තිබුණු කහවණු පොදියක් අහුලා ගැනීම නිසා කරදරයකට පත් වීමට ගිය ගොවියෙකු බේරා ගැනීමෙන් බුදුරජාණන් වහන්සේගේ,

1 ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය ප්‍රකට වේ.

2 පුරිස දම්ම සාරථී ගුණය ප්‍රකට වේ

3 අසරණ සරණ ගුණය ප්‍රකට වේ.

4 තාදී ගුණය ප්‍රකට වේ

06) උදය බමුණාගේ ආරාධනයෙන් බුදුරජාණන් වහන්සේ ඇතුලු ශ්‍රාවක පිරිස වේරංජා නුවර ගත කළේ,

1 පස්වන වස් කාලයයි.

2 අටවන වස් කාලයයි.

3 හයවන වස් කාලයයි.

4 දොළොස්වන වස් කාලයයි.

07) කායික හා වාචසික වශයෙන් අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකී යහපත් ක්‍රියාවන් හි යෙදීම

1 දානය නම් වේ.

2 සීලය නම් වේ.

3 අර් ථ චර් යාව නම් වේ.

4 සමානාත්මතාව නම් වේ.

08) භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතාවක් නොවන්නේ මින් කුමක් ද?

1 නිතර ධර්මය ඇසීම

2 යහපත් මිතුරු ඇසුර

3 උත්සාහයෙන් කැපවීමෙන් ක්‍රියා කිරීම

4 කය වචනය දෙකෙහි අසංවර බව

09) සිදුහත් බෝසතාණෝ කිං කුසල ගවේශී ව සිටි කාලයේ හමුවූ සප්ත සමාපත්ති ලාභියෙකි,

1 සවර්මිත්‍ර බමුණා.

2 භාගර්ව බමුණා.

3 ආලාර කාලාම තවුසා.

4 උද්දකරාම පුත්ත තවුසා.

10) ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද,
උතුම් වූ නිවනට සැපත් වූ හෙයින් ද,
බුදුරජාණන් වහන්සේ

1 සුගත නම් වන සේක.

2 ලෝකවිදූ නම් වන සේක.

3 බුද්ධ නම් වන සේක.

4 භගවා නම් වන සේක.

11) විකෘතියකින් විපරීතයකින් තොර ව ප්‍රකෘතිය ප්‍රකෘතියක් ලෙස ම දැන දැක පසක් කරන එකී නුවණ ලැබීමට උපකාරී වන භාවනාව

1 සමාධි භාවනාව නම් වේ.

2 චිත්ත භාවනාව නම් වේ.

3 ප්‍රඥා භාවනාව නම් වේ.

4 මෛත්‍රී භාවනාව නම් වේ.

12) ද්‍රව්‍ය ලෝකයෙහි පවත්නා කිසියම් වස්තුවක පවතින ද්‍රව ස්වභාවය හැඳින්වීමට බුදුදහමේ භාවිත වචනය වන්නේ,

1 පඨවි යන්න ය.

2 ආපෝ යන්න ය.

3 තේජෝ යන්න ය.

4 වායෝ යන්න ය.

13) සිතෙහි වැනෙන සුළු ගතිය හෙවත් අතීරණාත්මක ස්වභාවය අපූර්වත් කෙරෙන නීවරණය ............ නමින් හඳුන්වයි.

1 ව්‍යාපාද

2 ථීනමිද්ධ

3 උද්ධච්ච කුක්කුච්ච

4 විචිකිච්ඡා

14) තිලකුණු දන්නා තැනැත්තා තුළ ඇතිවන චරිත ලක්ෂණ අතරට අයත් නොවන්නේ,

1 ඉන්ද්‍රකීලයක් සේ දිවි ගෙවන්නේ ය.

2 අටලෝ දහමින් කම්පිත වන්නේ ය.

3 උපේක්ෂා සහගත වන්නේ ය.

4 අනතිමානී වන්නේ ය.

15 මහණෙනි, ඔබට මවක නැත. පියෙකු නැත. එහෙයින් මෙබඳු අවස්ථාවක දී ඔවුනොවුන්ට උපකාරී ව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය. මෙසේ වදාරමින් ගිලානෝපස්ථානය බුද්ධ පූජාවක් බවට පත් කිරීමට ආසන්නතම හේතුව වන්නේ,

1 උදරාබාධයකින් පෙළුණු භික්ෂුවගේ කතා පුවත ය.

2 පූතිගත්ත තිස්ස තෙරුන් පිළිබඳ කතා පුවත ය.

3 මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පිළිබඳ කතා පුවත ය.

4 මුගලන් මහ රහතන් වහන්සේ පිළිබඳ කතා පුවත ය.

16) බෝසතාණන් වහන්සේ...................... යන පාරමිතා පිරූ බවට පිළිවෙළින් මහාකපි, ලෝමහංස,වට්ටක යන ජාතක කතා නිදසුන් වේ.

1 සීල, නෙක්ඛම්ම, ප්‍රඥා

2 වීර් ය, ක්ෂාන්ති, අධිෂ්ඨාන

3 මෛත්‍රී, උපේක්ෂා, සත්‍ය

4 අධිෂ්ඨාන, දාන, වීර් ය

17) කුසල් යන්න හැඳින්වීමට යොදන පර්යාය පදයක් නොවන්නේ,

1 උදාසීන යන්න ය.
2 නිරෝගී යන්න ය.
3 දක්ෂ යන්න ය.
4 නිවැරදි යන්න ය.

## 18) සාමඤ්ඤඵල සූත්‍ර යේදී කාමච්ඡන්ද නීවරණය   උපමා කොට ඇත්තේ,

1 ණයගැතියෙකු ණය හිමියා කෙරෙහි ඇති බැඳීමට ය.

2 පිත්රෝගයෙන් පෙළෙන්නකුටය.

3 සිරගෙයක දුක් විදින්නෙකුය.

4 වනයක අතරමං වූවෙකුටය.

19) සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයමින් රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් රචනා කළ ග්‍රන්ථය කුමක් ද?

1 පාරමිතා ප්‍රකරණය

2 පොහොය දිනය

3 බෞද්ධයාගේ අත්පොත

4 ධර්ම විනිශ්චය

20) බෞද්ධයාගේ අත්පොත නම් වූ ධම්මපදය ග්‍රන්ථය සූත්‍ර පිටකයේ .................. අයත් වේ.

1 මජ්ඣිම නිකායට

2 සංයුත්ත නිකායට

3 අංගුත්තර නිකායට

4 ඛුද්දක නිකායට

21) සත්ත්වයාට නිදහසේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරන බැවින් බුදු දහම අවිහිංසාවාදී දහමකි.
මෙය පංච ශීලයෙහි

1 පළමු ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.

2 දෙවන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.

3 තෙවන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.

4 සිව්වන ශික්ෂා පදයෙන් තහවුරු කෙරේ.

22) ‘‘වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ ජීවත් වන්නෙමු’’ මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ පළමු පාදය ඇතුළත් පිළිතුර තෝරන්න.

1 සුසුඛං වත ජීවාම...
2 යො ච වස්සසතං ජීවේ......
3 සුභානුපස්සිං විහරන්තං......
4 වාරිජෝ’ව ථලේ ඛිත්තෝ......

23 නුවණින් පරීක්ෂා කර සිතා විමසා කටයුතු කිරීම,

1 සුචිකම්ම නම් වේ.

2 සඤ්ඤත නම් වේ.

3 නිසම්මකාරී නම් වේ.

4 ධම්මජීවී නම් වේ.

24) අභියෝගවලට මුහුණ දීමේ දී පාසල් සිසුවකු විසින් වර්ධනය නොකළ යුතු චාරිත්‍රයකි

1 නොසැලී ක්‍රියා කිරීම

2 විමසුම්ශීලී ව කටයුතු කිරීම

3 පක්ෂපාතී ව තීරණ ගැනීම

4 උපායශීලී ව බුද්ධිමත් ව කටයුතු කිරීම

24) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංසයක් නොවන්නේ මින් කුමක්ද ?

1 මහත් වූ හෝ සම්පත් අත්පත් කර ගැනීම

2 සිහි මුළා නොවී කළුරිය කිරීම

3 මරණින් මතු දුගතියෙහි උපත ලැබීම

4 ඕනෑම පිරිසක් මැදට නිභර්යව එළඹිය හැකි වීම

26) ‘‘සමගි වන්න. විවාද නොකරන්න’’. මෙම අදහස ඇතුළත් පාලි පාඨය තෝරන්න.

1 සමවායෝ ඒව සාධු

2 සමග්ගානං තපෝ සුඛෝ

3 සමග්ගා හෝථ මා විවදථ

4 වේරිනේසු අවේරිනෝ

27) දැඩි චේතනාවකින් තොර ව සිදු කරනු ලබන අසම්පූර්ණ කුසලා’කුසල කර්ම

1 ගරුක කර්ම නම් වේ.

2 ආචිණ්ණ කර්ම නම් වේ.

3 ආසන්න කර්ම නම් වේ.

4 කටත්තා කර්ම නම් වේ.

28 ක්‍රෝධය උපන් විට වෛරය උපදී. ක්‍රෝධය නිවීගිය විට වෛරය ද සංසිදෙයි. මෙම ප්‍රකාශය අර්ථ ගැන්වෙන බුදු දහමේ මූලික ඉගැන්වීම වන්නේ,

1 පටිච්චසමුප්පාද ධර්මය යි.

2 ත්‍රිලක්ෂණ ධර්මය යි.

3 ආර්ය අෂ්ඨාංගික මාර්ග ධර්මය යි.

4 චතුරාර්ය සත්‍ය ධර්මය යි.

29 මනා සිහි නුවණ ඇත්තෙකු සිය ධනය රැක ගනිමින් සාමකාමී දිවිපෙවෙතක් ගත කරයි. ඒ සඳහා පුද්ගලයාට මග පෙන්වන්නේ ගේහසික සීලයෙහි

1 දෙවන සිල් පදයෙනි.

2 සිව්වන සිල් පදයෙනි.

3 පස්වන සිල් පදයෙනි.

4 පළමු සිල් පදයෙනි.

30 පටිච්ච සමුප්පාද න්‍යායට අනුව උපාදාන යනු,

1 සිතින් දැඩිව අල්ලා ගැනීමයි

2 නැවත භවයට එක්වීමයි

3 කුසලාකුසල කර්ම රැස් කිරීමයි

4 ප්‍රතිසන්ධි සිත පහළ වීමයි

31) මව්පියන් බ්‍රහ්ම නමින් හඳුන්වන්නේ ඔවුන් තුළ ................. යන සුවිශේෂී ගුණාංග පවතින නිසාවෙනි.

1 ජාති, ජරා, ව්‍යාධි, මරණ

2 සද්ධා, සීල, චාග, පඤ්ඤා

3 මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා

4 පඨවි, ආපෝ, තේජෝ, වායෝ

32) කථාවත්ථුප්පකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම,

1 පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

2 තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

3 සිව්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

4 දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

33) අටලෝ දහමට අයත් අංගයක් ඇතුළත් නොවන පිළිතුර කුමක් ද?

1 වේදනා

2 නින්දා

3 අයස

4 අලාභ

34) දකුණු අත උඩට නවා ඇඟිලි සම්පූර් ණයෙන් ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන්නේ

1 ධ්‍යාන මුද්‍රාවයි

2 අභය මුද්‍රාවයි

3 ධමර්චක්‍ර මුද්‍රාවයි

4 විතකර් මුද්‍රාවයි

35 නිවැරදි ධන පරිහරණයේ දී පංචබලි නම් යුතුකම් පහක් උගන්වන්නේ,

- සිගාලෝවාද සූත්‍රයේ ය.
- ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.
- පරාභව සූත්‍රයේ ය.
- පත්තකම්ම සූත්‍රයේ ය.

# 36 සවන්දීමෙන් දියුණු කරගන්නා ප්‍රඥාව

- චින්තාමය ප්‍රඥාවයි
- සුතමය ප්‍රඥාවයි
- උපාදානමය ප්‍රඥාවයි
- භාවනාමය ප්‍රඥාවයි

37) අනුන්ගේ සිත් දැන ගැනීමට ශක්තිය ඇති ඥාණය කුමක්ද ?

1 පුබ්බේනිවාසානුස්සති ඥාණය

2 ආසවක්ඛය ඥාණය

3 පරචිත්ත විජානන ඥාණය

4 චුතූපපාත ඥාණය

38) තෙරුවන් කෙරෙහි කරුණු දැන ඇති කරගන්නා පැහැදීම .................... නම් වේ.

1 සීලය

2 කරුණාව

3 උපේක්ෂාව

4 අවෙච්චප්පසාදය

39) ත්‍රිශික්ෂාවට අනුව ආර් ය අෂ්ටාංගික මාර් ගයේ අංග බෙදා දැක්වූ කල්හි එහි සීල ශික්ෂාවේ ඇතුළත් නොවන මාර් ගාංගය වන්නේ

1 සම්මා වායාමය යි

2 සම්මා ආජීවය යි

3 සම්මා වාචා යි

4 සම්මා කම්මන්තය යි

40) ‘පරිසරය ආරක්ෂා කරන්නාට පරිසරයෙන් ආරක්ෂාව ලැබේ' මෙම අදහස තහවුරු කෙරෙන බුද්ධ චරිතයේ සුවිශේෂී අවස්ථාවකි

1 අනිමිස ලෝචන පූජාව

2 රුවන් ගෙහි වැඩ සිටීම

3 අජපාල නුගරුක මුල වැඩ සිටීම

4 මුචලින්ද නා රජුගේ සෙවණ ලැබීම

# ඔබට පිං
# තෙරුවන් සරණයි

- මහින්ද දිසානායක
- ගුරු උපදේශක
- කලාප අධ්‍යාපන කාර්යාලය
- තඹුත්තේගම